## Creations ...



### වැලිකතර - DESERT

නැඹුවෙමි දෙපා ගුවනින් වැලි කතර මත
සිතුවෙමි ඇත්ත ඇති හැටියට කඩින් කඩ
අදහස් වලින් ගලපා මගෙ සිතට එන
නැඹුවෙමි සිහිවටනයක් ගලපා පද පෙලක

දුටුවෙමි මග දෙපස මහ මැදුරු ගොඩක්
විසිතුරු වලින් ඒවා ඔප වැඩිලු හුගක්
මත දොල පිරුන මිනිසුන් රැඳිලාය හුගක්
විකිනී යනවා දුප්පත් අපෙ ශ්‍රමය ගොඩක්

මනිනවා දිනෙන් දින හරි හරියට වැඩලු
සැලසුම් පිරිවිතර නිතරම සිත රවටයිලු
නිම වෙන දත්ත පරිගනකය සරසයිලු
වෙහෙසන මනස සැමදා ඉකිබිඳිනවලු

සීමා වෙලා උඩු මහලක කොටු පවුරු
පරිගනකයෙන් දකිනවා ලොව විසිතුරු වූ
ගත වුන දිවියෙ හැම දිනකම මට සිතුනු
මේකද අපේ උරුමය අන් සතු කෙරුනු

යුතුකම් සියල්ලම රන් මසු වල තවරා
හැඩවෙන දිවිය වැලි කතරට යට කරලා
නතුවුන කඳුලකට සෙනහස නිහඬ වෙලා
කල හැකි දෙයක් නැත නවනම් ඉතිරිවෙලා

ගැලවෙන්නේ කොහොම මේ සටනින් යහලු
නොහැගෙන එකයි මට පුදුමයි ඒ සිතලු
අවැඩක් වෙලාදැයි මගෙ මනසට හැගුනු
දුක්විඳ සොයන්නේ කිමදැයි සිතුමොන් හොඳලු

ලලනි දොඩන්ගොඩ - 01/12/2010